තාක්ෂණ අමාත්‍යාංශය தொழில்நுட்ப அமைச்சு MINISTRY OF TECHNOLOGY

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
ஆட்களைப் பதிவு செய்யும் திணைக்களம்
DEPARTMENT FOR REGISTRATION OF PERSONS

10 වන මහල, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.
10 ஆம் மாடி, சுஹுருபாய, ஸ்ரீ சுபூதிபுர வீதி, பத்தரமுல்லை.
10th Floor, Suhurupaya, Sri Subhuthipura rd, Battaramulla.

මගේ අංකය / எனது இல. / My Ref. } DRP/OP/MEDIA/01 ඔබේ අංකය / உமது இல. / Your Ref. } දිනය / திகதி / Date } 2021.10. 21

"විශ්වසනීය පුද්ගල අනන්‍යතාව හැඳුනුම්පතයි" "அடையாள அட்டை - நம்பகத்தன்மையான தனிநபர் அடையாளம்" "Identity Card, the Trusted Personal Identity"

## මහජනතාව වෙත කරනු ලබන නිවේදනයයි.

### තාවකාලිකව අත්හිටුවනු ලැබූ ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ එක්දින සේවාව 2021.10.25 දින සිට නැවත ආරම්භ කිරීම

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් තාවකාලිකව අත්හිටුවනු ලැබූ **ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ එක් දින සේවාව දිනයක් හා වේලාවක් වෙන්කර ගන්නා ඉල්ලුම්කරුවන් සඳහා 2021.10.25 දින සිට යළිත් ආරම්භ කිරීමට** පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව තීරණය කර ඇත.

02. දෙපාර්තමේන්තු පරිශ්‍රය වෙත එකවර විශාල සේවාලාභීන් ප්‍රමාණයක් එක්රැස්වීමේ අවදානම් තත්ත්වය පිළිබඳ සලකා, **සීමිත සේවාලාභීන් පිරිසකට බත්තරමුල්ලේ පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් සහ ගාල්ල දකුණු පළාත් කාර්යාලයෙන් එක්දින සේවාව යටතේ ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමට කටයුතු සූදානම් කර ඇත.**

03. ඒ අනුව එක්දින සේවය මගින් ජාතික හැඳුනුම්පත් ලබා ගැනීමට අපේක්ෂා කරන සේවාලාභීන් තම ඉල්ලුම්පත ග්‍රාම නිලධාරී මගින් සහතික කර, අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පිහිටි හැඳුනුම්පත් ශාඛා කාර්යාලය වෙත යොමු විය යුතු අතර, එහිදී, **තමන්ට පැමිණිය හැකි පහසු දිනයක් හා වේලාවක් වෙන් කර ගත යුතුය.** නියමිත දිනයේදී නියමිත වේලාවට දෙපාර්තමේන්තුව වෙත පැමිණිය යුතු වේ. එසේ පැමිණීමට අපොහොසත් වන්නේ නම් නැවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යොමු වී වෙනත් දිනයක් ලබා ගත යුතුය.

04. මේ වන විට **සාමාන්‍ය සේවය යටතේ ජාතික හැඳුනුම්පත් ලබාගැනීම සඳහා අංක වෙන්කර ගත් ඉල්ලුම්කරුවන් හටද නියමිත දිනයේදී දෙපාර්තමේන්තුව වෙත පැමිණ තම ජාතික හැඳුනුම්පත් ලබාගැනීම සඳහා පහසුකම්** සළසා ඇති අතර, තවදුරටත් සාමාන්‍ය සේවය යටතේ යොමු කරන ඉල්ලුම්පත් ග්‍රාම නිලධාරී මගින් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ හැකි අතර, ඊට අදාල ජාතික හැඳුනුම්පත්ද අවම කාලයක් තුල කඩිනමින් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇත.

05. තවද, දෙපාර්තමේන්තු පරිශ්‍රයට පැමිණෙන සියලුම ඉල්ලුම්කරුවන් සෞඛ්‍ය ආරක්ෂණ උපදෙස් නිසි ලෙස පිළිපැදිය යුතුවේ.

වියානි ගුණතිලක
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්

දුරකථන / தொலைபேசி / Telephone } (011) 5226100 ෆැක්ස් / பெக்ஸ் / Fax } (011) 2862198 ඊ-මේල් / மின்னஞ்சல் / E-mail } info@drp.lk වෙබ් / இணையதளம் / Web } www.drp.gov.lk